ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024
4 වන මට්ටම
අවසන් පරීක්ෂණය
**LLU4707/ LWU 2313 – පවුල් නීතිය**
කාලය පැය 03 යි

---

දිනය : **2025** මැයි මස **15** වේලාව: ප.ව **1.30** - ප.ව **4.30**

---

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

මුළු ප්‍රශ්න ගණන 08 යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු විනිශ්චිත නඩු තීරණ හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉදිරිපත් කළ යුතුය**

**01.** ශ්‍රී ලංකා නීතිය යටතේ, පාර්ශවයන්ට තම විවාහය ලියාපදිංචි කිරීමෙන් හෝ චාරිත්‍රානුකූල විවාහයක අදාළ චාරිත්‍ර ඉටු කිරීමෙන් වලංගු විවාහයකට එළඹිය හැකිය."

එම විවාහ සිදු කර ගැනීමේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් මෙම විවාහ ආකාර දෙක විස්තර කරන්න. (ලකුණු 20)

**02.** භාරකාරත්ව ආරවුල් වලදී "දරුවාගේ උපරිම යහපත" සංකල්පය යොදන ආකාරය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ දරුවන්ගේ භාරකාරත්වය පාලනය කරන නීතිමය මූලධර්ම විවේචනාත්මකව සාකච්ඡා කරන්න, ඔබේ පිළිතුර තුළ රෝම ලන්දේසි නීති මූලධර්ම සහ අදාළ නඩු තීරණ ඇතුළත් විය යුතුය. (ලකුණු 20)

**03.** අසංක සහ විහඟි 2015 දී විවාහ විය. විවාහයෙන් පසු ඔවුන් කොළඹ මහල් නිවාසයකට ගියහ. මුලදී, ඔවුන්ගේ විවාහය සාමකාමී බවක් පෙනෙන්නට තිබුණත්, වසරක් ඇතුළත, විහඟි අසංකගේ හැසිරීම් වල දැඩි වෙනස්කම් දුටුවාය. අසංක බොහෝ විට කිසිදු හේතුවක් නොදන්වා රාත්‍රියේ නිවසට පැමිණෙන අතර සූදුවට අධික ලෙස මුදල් වියදම් කිරීමට පටන්

ගත්තේය. විහඟි ඔහුගෙන් ප්‍රශ්න කරන සෑම අවස්ථාවකම, අසංක ඇයට බැණ වැදුන අතර ඇය සැක සහිත සහ අවිශ්වාසවන්ත බවට චෝදනා කළේය. අවස්ථා කිහිපයකදී, ආරවුල් අතරතුර අසංක විහඟිට ශාරීරිකව පහර දුන්නේය.

අසංක ටෂිනි නම් කාර්යාලයේ මිතුරියක සමඟ අනියම් සම්බන්ධයක් පවත්වන බවට විහඟිට ඡායාරූප සහිත නිර්නාමික පණිවිඩ ලැබුණු විට තත්වය තවත් නරක අතට හැරුණි. විහඟි සාක්ෂි සහිතව අසංක ගෙන් මේ පිළිබඳව විමසූ විට, අසංක ඒ සම්බන්ධය පිළිගත් නමුත් එම සම්බන්ධය නතර කිරීම ප්‍රතික්ෂේප කරමින්, ඔහු තවදුරටත් විහඟිට ආදරය නොකරන බවත් ඇය "එයට හුරු විය යුතු බවත් නැතහොත් පිටව යා යුතු බවත්" පවසන ලදී.

මෙසේ තිබියදීත්, විහඟි අසංක සමඟ සමාදාන වීමට උත්සාහ කළ අතර මනෝ උපදේශනය සඳහා යොමු කිරීමට යෝජනා කළ නමුත් අසංක ඒ ගැන උනන්දුවක් දැක්වූයේ නැත. 2023 දී ඇති වූ ප්‍රචණ්ඩකාරී ආරවුලකින් පසු, අසංක ඇගේ පවුලේ සාමාජිකයන් ඉදිරිපිටදී විහඟිට පහර දුන් අතර, ඇය වෛවාහෙක නිවසින් පිටව ගොස් ඇගේ දෙමාපියන්ගේ නිවසට ආපසු ගියාය. මේ දක්වා විහඟි සම්බන්ධ කර ගැනීමට හෝ ඇය සමඟ සමාදාන වීමට අසංක කිසිදු උත්සාහයක් ගෙන නොමැත.

i. විහඟිට ලබා ගත හැකි නීතිමය පිළියම් පිළිබඳව ඇයට උපදෙස් දෙන්න. **(ලකුණු 15)**

ii. විවාහක යුවළ මුස්ලිම් නීතියෙන් පාලනය වුවහොත් ඔබේ පිළිතුර වෙනස් වේද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**04.** නයනජිත් සහ යුවනි 2021 දී සාමාන්‍ය නීතිය යටතේ විවාහ විය. ඔවුන් දිස්ත්‍රික්ක දෙකක රැකියාවල නිරත වූ අතර, විවාහයෙන් පසුව පවා නයනජිත් මාතර ප්‍රදේශයේ රැකියාව කරමින් ජීවත් වූ අතර, යුවනි අනුරාධපුරයේ රජයේ කාර්යාලයක සේවය කරමින් එහි ජීවත් විය. ඔවුන් ඉඳහිට එකිනෙකා බැලීමට ගියද, ඔවුන් බොහෝ විට රැකියාවට අදාළ හේතූන් මත වෙන්ව ජීවත් විය.

2024 මුල් භාගයේදී, යුවනි ගැබ්ගත් අතර පසුව ගැහැණු ළමයෙකු බිහි කළාය. කෙසේ වෙතත්, නයනජිත් දරුවා තමාගේ ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කළේය. ඔවුන් වෙන්ව ජීවත් වන අතරතුර යුවනි ඇගේ කාර්යාල සගයෙකු සමඟ ඇති කරගත් සමීප සම්බන්ධතාවයක් හේතුවෙන් දරුවා උපත ලැබූ බව ඔහු කියා සිටී.

නයනජිත් පැමිණි එක්තරා අවස්ථාවක දී දරුවා පිළිසිඳ ගත් බව යුවනි අවධාරණය කරන අතර කිසිදු නුසුදුසු සම්බන්ධතාවයක් ප්‍රතික්ෂේප කරයි. දරුවාගේ සුජාතභාවය සහ නීත්‍යානුකූල පියා නයනජිත් බව ඔප්පු කිරීමට ඇයට අවශ්‍ය වේ.

ඉහත තත්වයන්ට අනුව සුජාතභාවයේ පූර්ව නිගමයේ අදාළත්වය සහ මෙම උපකල්පනයේ මෑත කාලීන වර්ධනයන්හි කෙරෙහි අවධානය යොමු කරමින් පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

**05.** උදේෂ් සහ අනුෂි 2023 දී විවාහ වූ අතර ඔවුන්ට දරුවන් දෙදෙනෙක් සිටිති. 2024 දී, නිතර නිතර ඇති වන ගෘහස්ථ ආරවුල් හේතුවෙන්, අනුෂි දරුවන් සමඟ විවාහ නිවසින් පිටව ඇගේ දෙමාපියන් සමඟ ජීවත් වීමට ගියාය. ඇය දැනට රැකියා විරහිත වන අතර ඇගේ මහලු පියා මත මූල්‍යමය වශයෙන් යැපේ. ඉංජිනේරුවෙකු ලෙස සේවය කරන උදේෂ්, අනුෂි සාධාරණ හේතුවක් නොමැතිව ඔහුව හැර ගිය බවත් එබැවින් නඩත්තුවට හිමිකම් නොමැති බවත් පවසමින් කිසිදු මූල්‍යමය සහයෝගයක් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.

අනුෂි තමාට සහ පිළිවෙලින් වයස අවුරුදු 14 සහ 20 ක් වන ඇගේ දරුවන් දෙදෙනාට උදේෂ්ගෙන් නඩත්තු ඉල්ලා සිටීමට අපේක්ෂා කරයි.

ඔබ අනුෂිගේ නීති උපදේශකයෙකු යැයි උපකල්පනය කර 1999 අංක 37 දරන නඩත්තු පනත සහ රෝම ලන්දේසි නීතිය යටතේ අනුෂි සහ ඇගේ දරුවන්ට ලබා ගත හැකි නීතිමය පිළියම් පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

**06.** පහත සිදුවීම්වල නීතිමය වලංගුභාවය කෙටියෙන් සාකච්ඡා කරන්න:

i. ධනවත් ව්‍යාපාරිකයෙක වන සිරිදාස දරුවන් තිදෙනෙකුගේ පියෙකි. ඔහු අංශභාග රෝග තත්වයට ගොදුරු වූ පසු රැකබලා ගත් ඔහුගේ පෞද්ගලික සහකාර ජනාලි වෙත තම දේපළ සියල්ලම අන්තිම කැමති පත්‍රයක් මගින් බැහැර කරයි.

ii. 2000 වර්ෂයේදී විවාහ වූ ජයනාදන් සහ මීනාක්ෂි දරුවන් දෙදෙනෙකු සිටින තේසවලාමයි නීතියෙන් පාලනය වන යුවළකි. ජයනාදන් 2024 දී අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය යන අතර මීනාක්ෂි ඇය සහ ජයනාදන් එක්ව 2002 දී මිලදී ගත් ඉඩමක් ඇගේ සහෝදරයා වන ශිවනේෂ් වෙත විකුණයි.

iii. නෙළුම් සහ බණ්ඩාර යනු දීග විවාහක උඩරට යුවළකි. ඔවුන් 2013 දී නෙළුම්ගේ දෙමාපියන්ගේ නිවසට යන තෙක් බණ්ඩාරගේ පවුල සමඟ ජීවත් වෙති. නෙළුම්ගේ පියා 2024 දී අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය යන අතර, ඇය ඔහුගේ පාරම්පරික දේපළට අයිතිය ඉල්ලා සිටියි.

iv. දරුවන් නොමැති මුස්ලිම් යුවළක් වන අෆ්රත් සහ ෆාහිම්, හම්සාඩ් නම් මුස්ලිම් පිරිමි ළමයෙකු දරුකමට හදාගනී. ඔවුන් අන්තිම කැමති පත්‍රයක් නොමැතිව ගුවන් අනතුරකින් මිය යන අතර හම්සාඩ් ඔවුන්ගේ දේපළට අයිතිය ඉල්ලා සිටියි.

**(ලකුණු 05 x 4 = ලකුණු 20)**

**07.** ඇමරිකානු පශ්චාත් උපාධි ශිෂ්‍යාවක් වන ඇනීටා, දකුණු ආසියානු රටවල දරුකමට හදා ගැනීමේ නීති පිළිබඳ පර්යේෂණයක නිරත වෙයි. ශ්‍රී ලංකාවේ දරුකමට හදා ගැනීම සම්බන්ධ නීතිමය විධිවිධාන පිළිබඳ නිවැරදි හා සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට ඇය ඔබව සම්බන්ධ කර ගෙන ඇති බව උපකල්පනය කරන්න, ශ්‍රී ලාංකික පුරවැසියන්ට සහ ශ්‍රී ලාංකික දරුවෙකු දරුකමට හදා ගැනීමට කැමති විදේශීය යුවලක් (පුරවැසියන් නොවන) සඳහා අදාළ වන විවිධ අවශ්‍යතා කෙරෙහි ඇය විශේෂ අවධානයක් යොමු කරයි.

ඇනීටා සඳහා සටහනක් සකස් කරන්න. **(ලකුණු 20)**

**08.** පහත සඳහන් කරුණු පිළිබඳව සටහන් ලියන්න.

i. *නතාලි අබේසුන්දර එදිරිව ක්‍රිස්ටෝපර් අබේසුන්දර* (1998) 1 Sri LR 185 **(ලකුණු 07)**

ii. *අම්බලවානර් එදිරිව නවරත්නම්* (1955) 56 NLR 422 **(ලකුණු 07)**

**iii.** උත්ප්‍රේක්ෂිත විවාහය **(ලකුණු 06)**

**** *සියළුම හිමිකම් ඇවිරිණි* ****